# රුහුණ විශ්වවිද්‍යාලය

## 2018 / 2019 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/විශේෂ) උපාධි 2000 ස්ථලය

## පළමු සමාසික පරීක්ෂණය - 2019 ඔක්තෝබර්/නොවැම්බර්

## PAL 21523/21623 – අනිර්දිෂ්ට ග්‍රන්ථ, ගද්‍ය රචනය හා ත්‍රිපිටක සාහිත්‍ය ඉතිහාසය

**01, 02, 03** ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

කාලය: පැය 03 යි.

---

1. සිංහලට නගන්න.

සාවත්ථියං පන පඤ්චසතා කුලපුත්තා "එවං ඉමා අප්පමාදවිහාරිනියො භවිස්සන්තී" ති අත්තනො අත්තනො භරියායො විසාඛං මහා උපාසිකං පටිච්ඡාපෙසුං. තා උය්‍යානං වා විහාරා වා ගච්ඡන්තියො තාය සද්ධිං යෙව ගච්ඡන්ති. තා එකස්මිං කාලෙ "සත්තාහං සුරා ඡණා භවිස්සතී" ති ඡණෙ සුට්ඨෙ අත්තනො සාමිකානං සුරං පටියාදෙසුං. තෙ සත්තාහං සුරාපනං කීළිත්වා අට්ඨමෙ දිවසෙ කම්මන්තභෙරියා නික්ඛන්තාය කම්මන්තෙ අගමංසු. තාපි ඉත්ථියො "මයං සාමිකානං සම්මුඛා සුරං පාතුං න ලභිම්හ. අවසෙසා සුරා ච අත්ථි. ඉදං යථා තෙ න ජානන්ති තථා පිවිස්සාමා" ති විසාඛාය සන්තිකං ගන්ත්වා "ඉච්ඡාමයෙය්‍ය උය්‍යානං දට්ඨුං" න්ති වත්වා "සාධු අම්මා, තෙනහි කත්තබ්බ කිච්චානි කත්වා නික්ඛමථා" ති වුත්තෙ තාය සද්ධිං ගන්ත්වා පටිච්ඡන්නාකාරෙන සුරං නීහරාපෙත්වා උය්‍යානෙ පිවිත්වා මත්තා විචරිංසු.

විසාඛා "අයුත්තං ඉමාහි කතං. ඉදානි මං සමණස්ස ගොතමස්ස සාවිකා විසාඛා සුරං පිවිත්වා විචරතීති තිත්ථියා'පි ගරහිස්සන්තී" ති චින්තෙත්වා තා ඉත්ථියො ආහ. "අම්මා, අයුත්තං වො කතං. මම'පි අයසො උප්පාදිංතා. සාමිකාපි වො කුජ්ඣිස්සන්ති. ඉදානි කිං කරිස්සථා" ති.

(ලකුණු 12)

2. සිංහලානුවාදයක් සපයන්න.

දිවාවිහාරගතං භික්ඛුං ගඞ්ගාතීරෙ නිසින්නකං,
තං පෙති උපසඞ්කම්ම දුබ්බණ්ණා භීරුදස්සනා.

කෙසා චස්සා අතිදීඝා යාව භූමාවලම්බරෙ,
කෙසෙහි සා පටිච්ඡන්නා සමණං එතදබ්‍රවි.

පඤ්චපණ්ණාසවස්සානි යතො කාලකතා අහං,
නාභිජානාමි භුත්තං වා පීතං වා පන පානීයං;
දෙහි ත්වං පානීයං භන්තෙ තසිතා පානීයාය මෙ'ති.

අයං සීතොදිකා ගඞ්ගා හිමවන්තතො සන්දති,
පිව එත්තො ගහෙත්වාන කිං මං යාචසි පානීයං.

සචාහං භන්තෙ ගඞ්ගාය සයං ගණ්හාමි පානීයං,
ලොහිතං මෙ පරිවත්තති තස්මා යාචාමි පානීයං.

කින්නු කායෙන වාචාය මනසා දුක්කටං කතං,
කිස්ස කම්මවිපාකෙන ගඞ්ගා තෙ හොති ලොහිතන්ති.

(ලකුණු 12)

3. පාලියට නගන්න.

ම විසින් මෙ සේ අසන ලදී. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ බොහෝ භික්ෂු සඞ්ඝයා සමග කොසොල් රටේ සැරි සරති. (දිනක්) භාග්‍යවතුන් වහන්සේ මඟින් ඉවත් වැ එක් ගසක් මුලට එළඹැ පැන වූ අස්නෙහි හුන්හ.

එක්තරා ගොපල්ලෙක් බුදුන් වෙත පැමිණියේය. පැමිණ බුදුන් වැඳ එකත් පසෙකැ හිඳ ගති. භාග්‍යවතුන් වහන්සේ එකත් පසෙකැ හුන් ගොපල්ලා දැහැමි කතාවෙන් දක්වූහ. සමාදන් කැරැවූ. තෙද ගැන්වූහ. පහදවා ලූහ. දැහැමි කතාවෙන් දක්වුණු, සමාදන් කැරුණු, තෙද ගැන්වුණු පහදවනු ලැබූ ඒ ගොපල්ලා ''සවාමීනි, හෙට මගේ බත බික් සඟුන් සමග ඉවසා වදරණ සේක්වා'' යි ආරාධනා කෙළේය. නිහඬතාවෙන් භාග්‍යවතුන් වහන්සේ (එය) ඉවසා වදළ සේක. ඉක්බිති ගොපල්ලා බුදුන් ගේ ඉවසීම දැන අසුනෙන් නැඟිට පැදකුණු කොට ගියේය.

ඒ ගොපල්ලා ඒ රෑ ඇවෑමෙන් පසුද සිය නිවෙස්නෙහි බොහෝ වූ මඳ දිය මුසු වූ කිරි බත්, අලුත් ගිතෙල් පිළියෙල කරවා ''සවාමීනි, බත සූදානම්ය. දැන් සුදුසු කාලය'' යි බුදුනට කල් දැන්වීය. ඉක්බිති පෙරවරුවෙහි භාග්‍යවතුන් වහන්සේ පෙරෙවැ පා සිවුරු ගෙන බික් සඟුන් සමග ඒ ගොපල්ලා ගේ නිවෙස්නට වැඩියහ. වැඩ පැන වූ අස්-නෙහි හුන්හ. ඒ ගොපල්ලා බුදු පාමොක් මහ සඟන අඩුදිය ඇති කිරි බතින් ද, නව ගිතෙලින් ද සිය'තින් සැතැපවී: පැවරී.

(ලකුණු 12)

(ලකුණු 16)

4. ''ද්වාසීතිං බුද්ධතො ගණ්හිං - ද්වෙ සහස්සානි භික්ඛුතො
චතුරාසීති සහස්සානි - යෙ මෙ ධම්මං පවත්තිනො''
මෙය කෙතෙක් දුරට පිළිගත හැකි දැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

5. විනය නීති පැනවීම පිළිබඳ බුදුරදුන්ගේ ආකල්පය කෙබඳු දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

6. බුද්දකනිකාය පිළිබඳ ප්‍රථම සංගීති වාර්තාවන්හි අර්ථකථන සමාලෝචනය කරන්න.

(ලකුණු 10)

7. අභිධර්ම පිටකයෙහි ආරම්භය හා විකාශය සැකෙවින් දක්වන්න.

(ලකුණු 10)

@@@@@@@@@@@@@@@@@@@@